# A study of the origin and evolution of the Priesthood

## ප්‍රවෘජ්ජාවෙහි ආරම්භය හා එහි විකාශය පිළිබඳ අධ්‍යනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

### හැඳින්වීම

"පැවිදි වීම" යන්න සඳහා යෙදෙන්නා වූ පාලි භාෂාගත නාමය නම් "පබ්බජ්ජා" යන්නයි. එය සංස්කෘත භාෂාවට අනුව "ප්‍රවෘජ්ජා" යන්න යෙදී ඇත. මෙහි දැක්වෙන පදගථාර්ථයන් පිළබඳ විමසීමේ දී, සංස්කෘත ප්‍රවෘජ්ජා යන පදය "ප්‍ර" පූර්ව "වෘජ්" ධාතුවෙන් ද, පාලි භාෂාගත "පබ්බජ්ජා" යන්න "ප" පූර්ව "වජ" ධාතුවෙන් ද නිර්මාණය වී ඇත. මෙහි අදහස ලෙස මූලික වශයෙන් දැක්වෙන්නේ "ශ්‍රේෂ්ඨ වූ ගමන" යන අර්ථයයි. මීට අමතරව පිටත්ව යාම, ඉදිරියට යාම, නික්ම යාම යන අර්ථයන්[1] ද ඒ තුළින් අර්ථවත් වී ඇත. බුද්දක නිකායට අයත් ධම්මපද පාළියේ දැක්වෙන ආකාරයට, සිය කෙලෙස් මල දුරලන හෙයින් "පබ්බජිත" යැයි කියනු ලැබේ.

*"බාහිතපාපොති බ්‍රාහ්මණො*

*සමචරියා සමණොති වුච්චති*

*පබ්බාජයමත්තනො මලං*

*තස්මා පබ්බජිතොති වුච්චති[2] "*

එසේම රූපසිද්ධියෙහි විග්‍රහ කොට ඇති ආකාරයට, පබ්බජ්ජා යන්න තුළින් දැක්වෙන්නේ "පළමුව යා යුතුයි" යන අර්ථයයි.[3] තවද තාපස, ඍෂි, මුණි, ශ්‍රමණ යන පදයන් ද ප්‍රාග් බෞද්ධ යුගයේ ප්‍රවෘජ්ජාව හා සමාන වූ පදයක් ලෙස භාවිත කොට ඇත.

ප්‍රවෘජ්ජාවේ ආරම්භය පිළිබඳ විමසා බැලීමේ දී, එය ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් පැවත එන්නක් ලෙස ඓතිහාසික මූලාශ්‍රය තුළ දක්වේ. විශේෂයෙන් ඉන්දුනිම්න ශිෂ්ටාචාරයන් තුළ පවා පැවිදිවීමේ පිළිවෙත් පැවති බවට තොරතුරු දැක්වේ.

පාලි නිකායාගත සාහිත්‍යයේ නිරන්තරයෙන් හමුවන්නා වූ "සමණ" "බ්‍රාහ්මණ" යන පදයන්ගෙන් නිරූපණය වන්නේ ද මෙම ප්‍රවෘජ්ජා භූමියට පැමිණි පිරිස බව දැක්වෙන අතර, මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් දී.නි. බ්‍රහ්මජාල සූත්‍රය තුළ හමුවේ.

---

[1] A Sanskrit English Dictionary, Sri monier William, Oxford, Clarendon press, 1956,p.694

[2] ඛු. නි. ධම්මපදපාළි, බ්‍රාහ්මණ වග්ග, 06 ගාථාව.

[3] මහාරූපසිද්ධි, (සංස්) කළුකොඳයාවේ පඤ්ඤාසේඛර හිමි, කොළඹ, ඇම්. ඩී. ගුණසේන මුද්‍රණාලය, 1964, පිටුව 642.

එසේම ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් ප්‍රව්‍රජ්ජාව පැවති බවට නොයෙකුත් සාධක සිද්ධාර්ථ බෝසත් ජීවන කතාව තුළින් සොයාගත හැකිය. සිද්ධාර්ථ කුමරුන් බැලීමට පැමිණි සුද්ධොදන මහ රජුගේ ආචාර්ය වරයා වූ "කාලදේවල" තවුසා ප්‍රව්‍රජ්ජා භූමියට පැමිණි අයෙකි. එසේම ඔහු පඤ්ච අභිඥාවන් හා අෂ්ඨ සමාපත්තිලාභි අයෙක් ලෙස දක්වේ. මීට අමතරව, සිද්ධාර්ථ කුමරුන්ට හමුවන්නා වූ උද්දකරාම පුත්ත, ආලාර කාලාම වැනි තවුසන් ද, පස්වග තාපසයන් ද මෙම ප්‍රාග් බෞද්ධ යුගය තුළ ජීවත් වූ ප්‍රව්‍රජ්ජාවට පත් අය බව පැහැදිලිව දක්විය හැකිය.

මෙසේ ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් ප්‍රව්‍රජ්ජාව ආරම්භ වීමට බලපෑ මූලික කරුණු කීපයක් වේ. එහි දී ප්‍රධානම කාරණය ලෙස දක්වෙන්නේ වෛදික, බ්‍රාහ්මණ චින්තනයන්ගේ වූ දේව විශ්වාසය, යාගය, පූජකයා කේන්ද්‍ර වූ ආගමික ක්‍රියාදාමයන් නොඉවසූ පිරිසකගේ පැන නැගීමයි. ඔවුහු ඉන්ද්‍රනිම්න සභ්‍යත්වයට අයත් ආගමික සංකල්පයන්ගෙන් පෝෂණය ලබා, නව පැවිදි සම්ප්‍රදායයක් නිර්මාණය කළහ. මෙය පළමුවෙන්ම "පරිබ්‍රාජක" යන නාමයෙන් හැඳින් වූ අතර. මෙයට ඇතුලත් වූ පිරිස අනගාරික ජීවිතයකට යොමු වූහ. එසේම ඉන්ද්‍රනිම්න ශිෂ්ටාචාරය ආශ්‍රිතව පැවති යෝග භාවනාවන් පදනම් කොටගෙන ද නව ප්‍රව්‍රජ්ජා ක්‍රමයක් ආරම්භ වූ වග ඓතිහාසික මූලාශ්‍රය තුළ දක්වේ.

මෙසේ ආධ්‍යාත්මික සංවර්ධනයන් වෙත යොමු වූ පිරිස ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ ඔවුහු ආජීවක, නිගණ්ඨ, ජටිල, පරිබ්බාජක ආදි නොයෙකුත් කණ්ඩායම් වලින් යුක්ත විය. නමුත්, මෙම සියලු කණ්ඩායම් තුළ වූ පොදු ලක්ෂණ කිහිපයක් විද්වතුන්ගේ අවධානයට යොමු වී ඇත. එනම්,

- ආධ්‍යාත්මික පාරිශුද්ධිය ලැබීමෙන් පූජාර්හ වීම.
- අනුන්ගෙන් වැඳුම් පිදුම් ලැබීමට සුදුස්සන් වීම.
- සියලු ශ්‍රමණ කණ්ඩායම් කිසියම් ආගමික චින්තන සම්ප්‍රදායයක් දරන්නවුන් වීම.
- අනගාරික වීම.
- අනීෂ්වරවාදී වීම.
- මිනිසා තුළ ස්වාමීත්වය හා අදීනත්වය පිළිබඳ හැගීම් පහළ කිරීමට අනුබල දීම.
- සංචාරක ජීවිතයක් ගත කිරීම.
- බාහිර සමාජය සමඟ සබඳතා නොපැවැත්වීම.
- නිත්‍ය වූ වාසස්ථානයන් නොමැති වීම.
- භික්ෂාවෙන් ප්‍රත්‍ය සළසා ගැනීම.
- වර්ෂා ඍතුවේ පමණක් එක් ස්ථානයක වාසය කිරීම.
- ආශ්‍රම ධර්ම, යාගය, ස්වධර්ම ආදිය ප්‍රතික්ෂේප කිරීම.
- ශ්‍රැතමය ඥානයට වඩා භාවනාමය ඥානය උසස් කොට සැළකීම.

මේ ආරයෙන් ගිහි ප්‍රජාවට වෙනස් වූ, යම් ප්‍රතිපදාවකට අනුව ජීවත් විමට යොමු වූ මෙම පිරිස පිළිබඳ මූලික සූත්‍රාගත දේශනාවන් තුළ දක්වෙන්නා වූ කරුණු විමසීමේ දී ඔවුන් නොයෙකුත්

ආධ්‍යාත්මික සංවර්ධනයන් ලැබූ පිරිසක් බවට කරුණු දක්වේ. විශේෂයෙන් පඤ්ච අභිඤ්ඤාවන් හා අෂ්ඨ සමාපත්ති ලැබූ ශ්‍රමණවරු පිළිබඳ බොහෝ අවස්ථාවන්හි දී සාකච්ඡා වී ඇත.

## *බෞද්ධ පබ්බජ්ජාව*

මෙතෙක් පැවති ප්‍රව්‍රජ්ජාවට වඩා අතිශයින් ප්‍රායෝගික වූ පැවිදි දිවියක් බුදුසමය තුළ දකගත හැකිය. බෞද්ධ ප්‍රව්‍රජ්ජාව සිදුවන්නේ ධර්ම අවබෝධය හා ශාස්තෘ ප්‍රසාදය තුළිනි. ධර්මය හා ශාස්තෘවරයා පිළිබඳ ශ්‍රද්ධා ප්‍රතිලාභයට පැමිණි පුද්ගලයා, ගෘහ වාසය කෙලෙස් දූවිල්ලෙන් ගැවසීගත් මඟක් ලෙස සළකා, එහි සිටීමෙන් පිරිසිදු වූ බඹසර විසිය නොහැකි බව අවබෝධයෙන් කෙස් රැවුලු බා, කසාවත් හැද පොරවා, ප්‍රව්‍රජ්ජාවට පත්විය යුතු යැයි කල්පනා කරයි. එසේ සිතන්නා වූ පුද්ගලයා අල්ප වූ ද, මහත් වූ ද නෑදෑ පිරිවර හැරපියා අනගාරික පව්‍රජ්ජාවට පැමිණෙයි. මෙසේ ප්‍රව්‍රජ්ජාවට පැමිණ, ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් වසයි. ආචාර ගෝචර සම්පන්නව වාසය කරයි. අල්පමාත්‍ර වූ ද වරදෙහි බය දක්නා සුළුවෙයි. ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මෙයි. කුසල සහගත කායික වාචසික හා මානසික ක්‍රියාවෙන් යුක්ත වෙයි. ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙයි. භෝජනයෙහි පමණ දන්නේ වෙයි. සතිසම්පජන්න්‍යයෙන් යුක්ත වෙයි. සන්තුට්ඨියෙන් යුක්ත වෙයි. දී.නි. සාමඤ්ඤඵල සූත්‍රයෙහි උක්ත කාරණාව මෙසේ විග්‍රහ වී ඇත.

***"තං ධම්මං සුණාති ගහපති වා ගහපති පුත්තො වා අඤ්ඤතරස්මිං කුලෙ පච්චාජාතො සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලාභති. සො තෙන සද්ධා පටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්කති. සංබාධො ඝරාවාසො රජාපථො අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්ත පරිපුණ්ණං එකන්ත පරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බාජෙය්‍යන්ති.***

***සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාති පරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සු ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි.***

***සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛ සංවර සංවුතො විහරති. ආචාර ගොචර සම්පන්නො අනමත්තෙසු වජ්ජෙසු භයදස්සාවි සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. කාය කම්ම වචී කම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරොජ් භොජනෙ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො."[4]***

මෙසේ වූ බෞද්ධ ප්‍රව්‍රජ්ජාව, අනෙක් පැවිදි සම්ප්‍රදායයන්ගෙන් වෙන් වන්නේ කුමන කරුණක් නිසා ද යැයි ම.නි. චූළ සිහනාද සූත්‍රය තුළ විග්‍රහ වී ඇත.

මහණෙනි, ප්‍රථම ශ්‍රමණයාත් (සෝවාන්) මෙම සසුනෙහිමය. දෙවන ශ්‍රමනයාත් (සකදාගාමි) මෙම සසුනෙහිමය. තෙවන ශ්‍රමණයාත් (අනාගාමි) මෙම සසුනෙහිමය. සිව්වන ශ්‍රමණයාත් (අරහත්)

---

[4] දී.නි. සාමඤ්ඤඵල සුත්ත.

මෙම සසුනෙහිමය. අන්‍ය පරවාදයන් ශ්‍රමණත්වයෙන් ශූන්‍යය. මහණෙනි, මෙසේ මනාකොට සිංහනාද කරව්.

***"ඉධ භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො ඉධ තතියො සමණො ඉධ චතුත්ථො සමණො. සුඤ්ඤා, පරප්පවාදා, සමණෙහි අඤ්ඤෙහිති. එමමෙව භික්ඛවෙ සම්මා සීහනාදං නදථ."***[5]

මෙසේ අනෙක් ශ්‍රමණ ප්‍රව්‍රජ්ජාවන්ට වඩා බෞද්ධ පබ්බජ්ජාව වැදගත් වන ආකාරය චූළ සීහනාද සූත්‍රය තුළ තව දුරටත් විස්තර වී ඇත.

ලෝකයෙහි "භවදිට්ඨි" "විභවදිට්ඨි" වශයෙන් ප්‍රධාන දෘෂ්ඨි දෙකකි. යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ භව දෘෂ්ඨියෙහි ඇලුනේ, විභව දෘෂ්ටියට ප්‍රතිවිරුද්ධ වෙති. විභව දෘෂ්ටියෙහි ඇලුන අය භව දෘෂ්ටියෙහි ප්‍රතිවිරුද්ධ වෙති. එබඳු අය මෙම දෘෂ්ටි දෙකෙහි ඇතිවීමත්, නැතිවීමත්, ආශ්වාදයත්, ආදිනවයත්, නිස්සරණයත්, නොදකිති. එබඳු අය රාග සහිත වේ. ද්වේෂ සහිත වේ. මෝහ සහිත වේ. තෘෂ්ණා සහිත වේ. උපාදාන සහිත වේ. විදර්ශනා ප්‍රඥාවක් නොමැත. රාගයෙන් බැදුන, ක්‍රෝධයෙන් නිපුණ අය වෙති. ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස සහිත වෙති. දුකින් නොමිදෙති.[6]

මේ සියල්ලෙන් මිදුන බෞද්ධ භික්ෂුව කිසිදු දෘෂ්ටියකට යොමු නොවන අතර, ඔහු විසින් බැහැර කළ යුතු අන්ත දෙකක් පිළිබඳව දක්වා ඇත.

***"ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා යොචායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො යොචායං අත්තකිලමතානුයොගො***[7]***"***

බෞද්ධ පැවිදි දිවිය ගෙවන්නා පක්ෂියෙකුට බඳු වූ පැවැත්මක් ඇති කරගත යුතුය. සසුන් පිළිවෙතෙහි උද්යෝගිමත් පැවිද්දා කය පරිහරණය කිරීමට සෑහෙන සිවුරෙන් සෑහීමකට පත් වෙයි. කය පරිහරණය කිරීමට සෑහෙන පිණ්ඩපාතයෙන් සෑහීමට පත්වෙයි. යම් තැනකට චාරිකාවේ යත් ද, පා සිවුරු රැගෙනම යයි. යම් සේ පක්ෂියෙක් යම් යම් තැනකට ඉගිලියේ ද, පියාපත් බර සහිතවම ඉගිල්ලේ ද, එපරිද්දෙනි.

***"සෙය්‍යථාපිනාම පක්ඛි සකුණො යෙන යෙනෙව ඩෙති. සපත්තභාරොව ඩෙති. එවමෙව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡි පරිහාරියෙන පිණ්ඩපාතෙන යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති"***[8]

මෙසේ බෞද්ධ ප්‍රව්‍රජ්ජාව පුද්ගල ජීවිතය හා බොහෝ සෙයින් ප්‍රායෝගික වන ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ ඉදිදිරිපත් කිරීමට යොමු වී ඇත. කාම භෝගීත්වයත්, නිරර්ථක ආත්ම වාදයත්,

---

[5] ම.නි. චූළසීහනාද සුත්ත.

[6] එම.

[7] සං.නි. ධම්මචක්කප්පවත්තන සුත්ත.

[8] ම.නි. මහාතණ්හා සංඛය සුත්ත.

අත්හරින්නා වූ බෞද්ධ ප්‍රව්‍රජ්ජාවෙහි අවශ්‍ය වූ ප්‍රතිපදාව සපුරාලන්නේ ද පුද්ගල ජීවිතයට අනුචිත වූ බර පැටවීමක් ලෙස නොවේ. එක්තාරා දේවතාවෙක් බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසීය.

**දේ:** සංසාර ඕඝය තරනය කළේ කෙසේ ද. ***(කථන්නු ත්වං මාරිස ඕඝමතරීති)***

**බු:** මම එකතැන නො පිහිටමින් ද, වෑයම් නොකරමින් ද ඕඝය තරණය කළෙමි. ***(අප්පතිට්ඨං ඛ්වාහං ආවුසො අනායූහං ඔඝමතරිං)***

**දේ:** එසේ කරන්නේ කෙසේ ද

**බු:** යම් විටෙක පිහිටා සිටිය හොත් එකල්හි ගිලෙමි. වෑයම් කළහොත් ඉල්පෙමි. එහෙයින් මම නොපිහිටමින් ද, වෑයම් නොකරමින් ද, සංසාර ඕඝය තරනය කළෙමි[9]

මෙයින් ද බෞද්ධ ප්‍රව්‍රජ්ජාව තුළ සසුන් මඟ ඉදිරියට ගමන් කරන ආකාරයෙන් පැවැත්මට යෝග්‍ය ක්‍රියා පිළිවෙතක් නිර්දේශ කිරීමට යොමු වී ඇති බව මනාව පැහැදිලි වේ.

## බෞද්ධ ප්‍රව්‍රජ්ජා ක්‍රම

### ❖ ආරම්භක බෞද්ධ පැවිදි ක්‍රමය (එහි භික්ඛු පබ්බජ්ජා)

මහාවග්ග පාළියේ මහාක්ඛන්ධකයට අනුව, පැවිද්ද හා උපසම්පදාව මුල් ම යුගයේ දී ආබද්ධව පැවතුණි. සංඝ ශාසනය ආරම්භ වූ මුල්ම කාලපරිච්ඡේදය තුළ බුද්ධ ශ්‍රාවකයන් වනු කැමති වූ සියලු දෙනාට ම පැවිද්දත් උපසම්පදාවත් එකවරම ලැබිණි. එහෙත් පසුකාලීනව මෙහිලා තත්ත්ව දෙකක් නිර්මාණය වූ හෙයින් පැවිද්ද හා උපසම්පදාව ද වෙන් වෙන් වූ අවස්ථා දෙකක දී ලබා දීමට යොමු වී ඇත. එහෙයින් ඒ හා බැඳි විනය නීතින් ද ක්‍රමානුකූලව සංවර්ධනයට භාජනය වී ඇත.

සංඝ ශාසනයේ ආරම්භක පැවිද්දෝ වයසින් මුහුකුරා ගිය ජීවිතය පිළිබඳ විවිධ වූ අත්දැකීම් ඇත්තෝ වූහ. ඇතැම් අය ශ්‍රමණ සම්ප්‍රදායයන්ටම අයත් ජටිල පරිබ්‍රාජක ආදි වූ වෙනත් නිකායයන් තුළ බොහෝ කලක් පුහුණු ලද්දෝ වූහ. එම නිසා බුදුරජාණන් වහන්සේ "එහි භික්ඛු" නමින් හැඳින්වෙන විශේෂ වූ පැවිදි ක්‍රමයකින් ඔවුන් සසුනට ඇතුළත් කර ගත්හ.

බෞද්ධ සාසන ඉතිහාසය තුළ මෙම පැවිදි ක්‍රමයෙන් ප්‍රව්‍රජ්ජාවට පත් පළමු පිරිස ලෙස දැක්වෙන්නේ පස්වග තවුසන්ය. බුදුරජාණන් වහන්සේ තම පළමු ධර්ම දේශනය සිදු කිරීමට තෝරාගනු ලැබුවේ ද බෝසත් අවදියේ දී තමන්ට උදව් උපකාර කරන ලද්දා වූ මෙම පඤ්ච වග්ගිය භික්ෂූන්මය. ඔවුනට දහම් දෙසීමෙන් පසු පළමුව කොණ්ඩඤ්ඤ තවුසා ද, දෙවනුව භද්දිය වප්ප යන තවුසන් දෙදෙනා ද, තෙවනුව මහානාම අස්සජි යන තවුසන් දෙදෙනා ද සෝතාපන්න වූ අතර, පසුව ඔවුහු බුදුසසුනේ පැවිද්ද ඉල්ලා සිටියහ.

එහි දී බුදුරජාණන් වහන්සේ දක්වා සිටියේ උක්ත "එහි භික්ඛු" මහණ උපසම්පදාවයි. මහාවග්ග පාළියේ එය මෙසේ දැක්වේ.

---

9 සං.නි. ඕඝතරණ සුත්ත.

"මහණෙනි, එව. ධර්මය මැනවින් ප්‍රකාශිතය. මැනවින් දුක් කෙලවර කිරීම පිණිස, බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්න. යනුවෙනි. ඒ ප්‍රකාශයම ආයුෂ්මතුන් හට මහණ උපසම්පදාව වේ."

***"එථ භික්ඛවොති භගවා අවොච ස්වාක්ඛාතො භගවතා ධම්මො චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායාති සාවතෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි"***[10]

මෙසේ සසුනෙහි ආරම්භ වූ එහි භික්ඛු පැවිදි උපසම්පදාව පිළිබඳ සමන්තපාසාදිකාවේ ද කරුණු සඳහන් වේ. එහි බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම බෝධි සමයට අයත් මෙම එහි භික්ඛු පැවිදි ක්‍රමයෙන් ප්‍රව්‍රජ්ජාවට පත් පිරිස එක්දහස් තුන්සිය හතලිස් එකක් බව දැක්වේ.

***"තිණිසතං සහස්සඤ් ච චත්තාලීසං පුනාපරෙ***

***එකො ච ථෙරො සප්පඤ්ඤො සබ්බෙ තෙ එහි භික්ඛුකා***[11]

මෙහි පඤ්ච වග්ගිය භික්ෂූන් ද, යසකුල පුත්‍රයා හා ඔහුගේ යාළුවෝ පනස් හතර දෙනා ද, භද්දවග්ගිය කුමාරවරු තිස්දෙනා ද, පුරාන ජටිලයන් දහස ද, අග්‍ර ශ්‍රාවක දෙදෙනා ඇතුළු දෙසිය පණසක් පරිබ්බ්‍රාජකයෝ ද, අංගුලිමාල තෙරුන් වහන්සේ ද ඇතුලත් වූහ.

මීට අමතරව විනය පිටක පාලියේ නිර්දේශ නොවුණ, තවත් විසිහත් දහස් තුන්සිය දෙනෙක් පිළිබඳව සමන්තපාසාදිකාවේ සඳහන් වේ.

***"සත්තවිස සහස්සානි තීණියෙව සතානි ච***

***එතෙහි සබ්බෙ සඞ්ඛාතා සබ්බෙ තෙ එහි භික්ඛුකා"***[12]

ඒ අනුව තුන්සියයක් පිරිවර සහිත සේල බමුණා ද, දහසක් පිරිවර සමග මහාකප්පින රජතුමා ද, දස දහසක් කපිලවස්තු වැසියන් ද, දාසය දහසක් පාරායණික බමුණන් ද එහි භික්ඛුභාවයෙන් පැවිදි වුවෝ වෙති.

"එහි භික්ඛු" උපසම්පදාව ලබන්නේ "එහි භික්ඛු" යන වචන මාත්‍රයෙනි. එහි භික්ෂු පැවිදි උපසම්පදාව සඳහා හේතු සම්පත් ඇති පුද්ගලයෙකු දුටුවිට, දහම් දෙසා, සාසන බ්‍රහ්ම චරියාවේ කැමති වන්නේ නම් ඔහු වෙත ශ්‍රී හස්තය දිගු කොට බුදුරජාණන් වහන්සේ බ්‍රහ්ම ස්වරයෙන් මහණ, මෙහි එව, මැනවින් දුක් කෙලවර කරණු පිණිස මාගේ සාසන බ්‍රහ්ම චරියාවේ හැසිරෙන්න. යැයි ආමන්ත්‍රණය කරති. එසේ බුදුඑජාණන් වහන්සේ ශ්‍රී හස්තය දිගු කොට සාසන බ්‍රහ්ම චරියාවේ හැසිරීමට කැමැත්තා වූ ගිහියාට කතා කල විට, බුදුරජාණන් වහන්සේගේ එම වචනයෙන්ම ගිහි සළකුණු අතුරුදහන් වී, කසාවත් හැද පෙරවෙයි. එකක් හැද, එකක් පොරවා, එකක් උරෙහි ලා, වම් උරයෙහි පාත්‍රය ලා සැටවයස් පිරුණු මහතෙර නමක් සේ සතර ඉරියව්වෙන් ද සංවරව බුදුරජාණන් වහන්සේම ආචාර්ය උපාධ්‍යාය කොට බුදුන් වදියි. මෙයම ඔහුට පැවිදි උපසම්පදාව වෙයි.

[10] මහාවග්ග 1, පිටුව 26, බු.ජ.මු.

[11] සමන්තපාසාදිකා 1, පිටුව 170, හේ.මු.

[12] සමන්තපාසාදිකා 1, පිටුව 171, හේ.මු.

## ❖ තිසරණ පබ්බජ්ජාව

බුදුසසුන ආරම්භ වී කල්යත්ම යත්ම පැවිදි වීමට කැමති පිරිස වැඩිවූ නමුත් එම පිරිසට ඉතා දුර බැහැර සිට වෙහෙස මහන්සි වී බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණීමට සිදුවුණි. එමනිසා අතරමග දී බොහෝ කරදරවලට මුහුණ දීමට ද ඇතමෙක්ට සිදු වී ඇත. එබැවින් මෙම පැවති ප්‍රව්‍රජ්ජා ක්‍රමය බොහෝ දෙනාට වෙහෙසකාරි තත්වයක් වූ බැවින් බුදුරජාණන් වහන්සේ එම ක්‍රමය වෙනස් කොට ඒ ඒ ප්‍රදේශවල දී ගිහියන් පැවිදි කිරීමත්, උපසම්පදා කිරීමත් භික්ෂූන්ට පවරා දෙන ලදි.

"***යන්නූනාහං භික්ඛූනං අනුජානෙය්‍යං තුම්හෙවදානි භික්ඛවෙ තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ උපසම්පාදෙථ"***[13]

මෙම වරප්ප්‍රසාදය බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට පවරා දුන් නමුදු, එහි භික්ඛු පැවිදි උපසම්පදාව ලබාදීමේ හැකියාවක් භික්ෂූන්ට නොතිබිණි. එය බුදුරජාණන් වහන්සේලාගේ කාර්යයක් පමණක් විය. එබැවින් සංඝයාට ගිහියන් පැවිදි උපසම්පදා කිරීමේ ක්‍රමයක් නිර්දේශ කළ යුතු විය. මෙයට විසඳුමක් ලෙස බුදුරජාණන් වහන්සේ "සරණාගමන" පැවිදි උපසම්පදාව හඳුන්වා දුන්හ. " තිසරණ ගමන පැවිදි උපසම්පදාව" යනු තෙවරක් තෙරුවන් සරණ සමාදන් වීමයි. එය තෙවරක් වාචසිකව පැවසීමෙන් මෙම පැවිදි උපසම්පදාව සිද්ධ වේ.

***"තීහි සරණගමනෙහි උපසම්පන්නොති බුද්ධං සරණං ගච්ඡාමීති ආදිනාතයෙන තික්කත්තුං වාචාං භින්දිත්වා වුත්තෙහි තීහි සරණාගමනෙහි උපසම්පන්නො"***[14]

මෙයින් පැවිදි උපසම්පදා ක්‍රමයෙහි යම් විකාශන අවස්ථාවක් දක්නට ඇත. පැවිදි උපසම්පදාව අපේක්ෂාවෙන් පැමිණි ගිහියාගේ පළමු කොටම හිස රැවුල බා, කසාවත් හඳවා, තනිපට සිවුර ඒකාංශ කරවා, සංඝයාගේ පා වැන්දවිය යුතුය. ඉන්පසුව උක්කුටිකයෙන් හිඳුවා, ඇඟිලි බඳවා, තිසරණය තුන් වරක් කියවීමෙන් මෙම පැවිදි උපසම්පදාව සිදුවන්නේය.

මෙම ක්‍රමය නිසා සාසනයේ විකාශනය ඉතා වේගවත්ව සිදුවිය. එසේම මෙම පැවිදි කිරීමේ ක්‍රමය තුළ රැකිය යුතු කිසිදු විනය ප්‍රඥප්තියක් ද බුදුරජාණන් වහන්සේ විසින් දේශනා නොකළ අතර, ඒ තුළ කිසිදු සමාදන් කරවීමක් ද නොතිබිණි. සැදැහැවත් බවෙන්, සත්‍යාවබෝධයෙහිලා පැවති අව්‍යාජ අධිෂ්ඨානයෙන් යුත් මුල් යුගයේ භික්ෂූන්ට ධර්මයේ ඇතුලත් සීල ශික්ෂාවම ප්‍රමාණවත් විය.

---

[13] මහාවග්ග 1, පිටුව 44, බු.ජ.මු.

[14] සමන්තපාසාදිකා 1, පිටුව 171, හේ.මු.

## ❖ සාමණේර පැවිද්ද

ප්‍රවෘජ්ජා භූමියෙහි "සාමණේර" හා "උපසම්පදා" යනුවෙන් දෙවදෑරුම් වර්ගීකරණයක් පසුකාලීනව වේ. මෙයින් සාමණෙර පැවිද්ද අනුදන වදාරණු ලැබූ ආකාරය මහා වග්ගපාළියේ දක්වා ඇත

"මහණෙනි තිසරණ ගමනයෙන් සාමණෙර ප්‍රවෘජ්ජාව අනුදනිමි"

***"අනුජානාමි භික්ඛවෙ ඉමෙහි තීහි සරණාගමනෙහි උපසම්පන්නො"***[15]

මෙම පැවිදි කිරීමේ ක්‍රමය ආරම්භ වූයේ රාහුල කුමරුගේ පැවිදි කිරීමත් සමඟය. රාහුල කුමරුන් දායාද ඉල්ලමින් බුදුරජාණන් වහන්සේ පිටුපස පැමිණි අතර, බුදුරජාණන් වහන්සේ ඔහුට සාසනික දායාදය ලබාදීම සඳහා රාහුල කුමරු පැවිදි කරන ලෙස සැරියුත් හිමියන්ට පැවරූහ.

***"යස්මා ච අයං දායජ්ජං යාචති. තස්මා ලොකුත්තරදායජ්ජපටිලාභාය පබ්බාජෙහි ති අත්ථො"***[16]

මෙහි දී සැරියුත් හිමියන් රාහුල කුමරු කෙසේ පැවිදි කරන්නේදැයි විමසූ කළ, බුදුරජාණන් වහන්සේ මෙම ක්‍රමය හඳුන්වා දුන්හ. එනම් කෙස් රැවුල බහා, කසාවත් අන්දවා, උත්තරා සංගය එකස් කරවා,ා භික්ෂූන්ගේ පා වන්දවා, උක්කුටිකයෙන් හිඳුවා, ඇගිලි බන්දවා, තෙවරක් තිසරණය කියවීමයි.

මේ සමඟම සාමණේර හා උපසම්පදා වශයෙන් සංඝයා තුළ ප්‍රභේද දෙකක් නිර්මාණය විය. සත්‍ය ලෙසම මෙම සාමණේර පබ්බජ්ජාව යනු "රාධ" නම් බමුණා විෂයෙහි වූ ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාවට ප්‍රථම වූ තිහිසරණාගමන උපසම්පදාවම බව පෙනේ. මෙහි ඇති වෙනස නම් මෙම පබ්බජ්ජාවේ දී උපසම්පදා ප්‍රධානයක් සිදු නොවීමයි. තීහිසරණාගමන උපසම්පදාවේ දී පුද්ගලයෙකු පැවිදි උපසම්පදා කළ පරිදිම ප්‍රවෘජ්ජාපේක්ෂකයාගේ කෙස් රැවුල් බා, කසාවත් හැද පොරවා, උත්තරාංශ ඒකාංශ කොට, භික්ෂූන්ගේ පා වන්දවා, උක්කුටිකයෙන් හිඳුවා, ඇගිලි බදවා, තිසරණ ගන්වනු ලබයි. මෙයම සාමණේර පැවිද්ද විය. නමුත් පසුකාලීනව සාමණේරවරුන්ගේම ප්‍රශ්න කිරීමකට අනුව සමාදන්ව ආරක්ෂා කරනු පිණිස ඔවුන්ට දස ශික්ෂාවන් පැනවීමට බුදුරජාණන් වහන්සේ කටයුතු කළහ.

බොහෝ වියතුන්ගේ මතයට අනුව මෙම පැවිදි ක්‍රමය බුදුරජාණන් වහන්සේ හඳුන්වා දෙනු ලැබුවේ සංඝ සමාජයට ඇතුලත් වීමට සිටින, ඉක්මනින් උපසපන් වීමට නොසිතන පිරිසට ලබා දෙන්නා වූ අවස්ථාවක් ලෙසය.

---

[15] මහාවග්ග 1, පිටුව 46, බු.ජ.මු.

[16] මහාවග්ග 1, පිටුව 204, බු.ජ.මු.

## ❖ උපසම්පදාව

පැවිදි කළ යුත්තේ කවුරුන් ද, නොකළ යුත්තේ කවුරුන් ද, ඒ සඳහා තිබිය යුතු සුදුසුකම්, වයස් සීමාවන් පිළිබඳ මුල දී සම්මතයක් නොතිබිණි. ලාබාල දරුවන් පැවිදි උපසම්පදා කිරීමෙන් අනතුරුව නිර්මාණය වූ ගැටළු නිසා විසිහැවිරිදි වියට පත්වූවන් පමණක් උපසම්පදා කළයුතු යැයි නියමයක් ඇතිවිය. මෙහි දී පැවිදි බවේ සිට උපසම්පදාව තෙක් හික්මීම ලබන අය සාමණේර තත්වයෙන්ම සිටිය යුතු විය. ඔහු පරිසමාප්ත අර්ථයෙන්ම "සංඝ" ගණයේ සාමාජිකයෙකු නොවන අතර, එහි සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබමින් සිටින්නෙකි.

සාමණේරවරයෙකුට ශාසනික නියමිත උරුමය ලැබෙන්නේ උපසම්පදාව ලැබීමෙන් අනතුරුවය. සසුනෙහි පනවා ඇති උසස්ම ශීලය උපසම්පදා ශීලයයි. එම ශීලය අධිශීල ශික්ෂාවකට අයත් වන්නේ අධිචිත්ත ශික්ෂාවට පදනම් වන බැවිනි. උපසම්පදාව ලැබීමෙන් පසුව භික්ෂුව, "භික්ඛු සංඝ" යන පිරිසට අන්තර්ගත වේ. සාමණේර භික්ෂුවක් උපසම්පදාවේ දී අනුගමනය කරන්නා වූ විධි අටක් විනය පිටකයේ දක්වේ.

01. එහිභික්ඛු උපසම්පදාව.

02. සරණාගමන උපසම්පදාව.

03. ඥත්තිචතුත්ථ කම්ම උපසම්පදාව.

04. ඕවාද පටිග්ගහන උපසම්පදාව.

05. පඤ්හාබ්‍යාකරණ උපසම්පදාව.

06. අට්ඨ ගරුධම්ම පටිග්ගහණ උපසම්පදාව.

07. දූතෙන උපසම්පදාව.

08. උට්ඨවාචික උපසම්පදාව.

***"යො භික්ඛවෙ අඤ්ඤොපි අඤ්ඤතිත්ථිය පුබ්බො ඉමස්මිං ධම්ම විනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං ආකඞ්ඛති උපසම්පදං තස්ස චත්තාරො මාසෙ පරිවාසො දාතබ්බො"***[17]

මෙම උසම්පදා ක්‍රමයන් අතර, යට දක් වූ "එහි භික්ඛු" පැවිදි උපසම්පදාව හා "සරණාගමන" උපසම්පදාව පසුකාලයේ දී ප්‍රමාණවත් නොවූ අතර, මින් අනතුරුව "ඥත්ති චතුත්තකම්ම" උපසම්පදාව දක්වා ඇත. මහණෙනි, මා විසින් තුන් සරණ ගමනින් යම් උපසම්පදාවක් අනුදක්නා ලද ද, එම උපසම්පදාව අද පටන් ප්‍රතික්ෂේප කරමි. ඤත්ති චතුත්ථ කර්මයෙන් උපසම්පදා කිරීම අනුදනිමි. යනුවෙන් මහාවග්ග පාලියේ මෙම බුද්ධ නියමය දක්වා ඇත. "ඤත්ති" යනු දැනුම් දීමයි. නියමිත පරිදි රැස් වූ සංඝ සභාවක දී, උපසම්පදා අපේක්ෂක සාමණේරයා පිළිබඳ යෝජනාව තුන්

---

[17] මහාවග්ග 1, පිටුව 172, බු.ජ.මු.

වතාවක්ම ඉදිරිපත් කොට අදහස් විමසා සිව්වැනිව සම්මතයකට එළඹීම ඤත්තිචතුත්ථ කම්ම නම් වේ.

"ඕවාද පටිග්ගහණ" උපසම්පදාව නම්, "කස්සප" නම් හිමියන්ට අනුදත් උපසම්පදාව මෙන් ශ්‍රමණත්වය තථාගත අවවාද පිළිගැනීම් වශයෙන් විශ්වාසය පළ කිරීම, මෙම උපසම්පදාව ලෙස පිළිගැනීමයි.

"පඤ්හාවයාකරණ" උපසම්පදාව නම් "සෝපාක" හිමියන්ට අනුදත් උපසම්පදාවයි. දශ අශුභ නිශ්‍රිත ප්‍රශ්න විචාරීමෙන්, ඒවා විසඳූ සෝපාක හිමියන් ගැන සතුටු වීම, එම උපසම්පදාව ලෙස පිළිගත් බව බුදුගොස් හිමියෝ සමන්තපාසාදිකාවේ සඳහන් කරති.

අට්ඨගරු ධර්ම පිළිගැනීමම "අට්ඨගරුධම්ම පටිග්ගහණ" උපසම්පදාව නම් වේ. එසේම "දූතෙන" උපසම්පදාව නම්, දූතයෙකු මාර්ගයෙන් උපසම්පදාව ප්‍රධානය කිරීමයි. එය "අඩ්ඪකාසි" ගණිකාවට අනුමත කරන ලද්දා වූ උපසම්පදාවයි. භික්ෂු භික්ෂුණී උභතො සංඝයාගේ සම්බන්ධතාවෙන් සම්මත උපසම්පදාව "අට්ඨවාචික" උපසම්පදාවයි. භික්ෂුණී සංඝයාගේ ඤත්තිචතුත්ථ කම්මවාචාවත්, භික්ෂු සංඝයාගේ ඤත්ති චතුත්ථ කම්මවාචාවත් දෙකම මෙහි දී ප්‍රකාශ වන හෙයින් "අට්ඨවාචික" යැයි මෙය දක්වා ඇත.

මෙයින් "ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව" යනු භික්ෂු සංඝයාගේ උපසම්පදාවයි. දැනට පවත්නා වූ උපසම්පදා ක්‍රමය ද මෙයම වේ.